# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 42 — 1973 ජනවාරි 12 වැනි සිකුරාදා — 1973 01.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී).


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 25 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


# තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව, යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට ඇති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**3. සෙවයට භාර ගැනීම පිළිබඳ කොන්දෙසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිතුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වනනන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව අප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙසු සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සෙවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්තම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයැදුම්පත් 1973 පෙබරවාරි මස 09 වෙනි දිනට හෝ ඊට පෙර, "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කෝට්ටේ පාර, කොළඹ 8" යන මගේ රාජකාරි ලිපිනයට ලැබෙන්න සැලැස්විය යුතුය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය ළමිසේ ය. වර්ෂයකට රු. 5,736—144×6—රු. 180×8 සහ 240×6—රු. 9,480 කි. වර්ෂයකට රු. 6,780, රු. 7,500 සහ රු. 8,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

**කාර්යක්ෂමතා කඩඉම් :—**

(i) සේවයේ ස්ථිර කිරීමට ප්‍රථම දෙපාර්තමේන්තු නීතිරීති, මුදල් රෙගුලාසි, පාලන රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග හා ආරෝග්‍යශාලා පරිපාලනය සම්බන්ධව පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

(ii) වර්ෂයකට රුපියල් 6,780 ක් ඔබ්බට යාමට ප්‍රථම වූ කාර්යක්ෂමතා කඩඉම් සඳහා දෙවෙනි භාෂාව පිළිබඳ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(iii) වර්ෂයකට රුපියල් 7,500 ක් ඔබ්බට යාමට පෙර වූ කාර්යක්ෂමතා කඩඉම් සඳහා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ පහත සඳහන් ඕනෑම විෂයයන් දෙකකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයේ විෂයයන් ආයුර්වේද කොමසාරිස් විසින් නියමනය කරනු ලැබේ.

(1) රෝග නිවාරණය සහ සෞඛ්‍යාරක්ෂාව. (ආයුර්වේද)

(2) පංචකර්ම චිකිත්සා.

(3) පෝෂ්‍යදායී ආහාර.

(4) කුමාර චිකිත්සා.

(5) නාඩි ඥානය.

(6) දන්ත විද්‍යාව.

(7) මානසික රෝග ආදිය.

(iv) රු. 8,280 ක් ඔබ්බට යාමට පෙර පශ්චාත් උපාධි සුදුසුකම් සහ ආයුර්වේදය පිළිබඳ මුලික පර්යේෂණ හෝ ආයුර්වේදය පිළිබඳ නොයෙකුත් ප්‍රකාශන පළ කිරීමෙන් ලත් කීර්තිය යනාදියෙන් සමන්විත කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—

(i) මෙම තනතුරු ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—

(i) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ii) 1973 පෙබරවාරි මස 09 වැනි දිනට වයස අවුරුදු 23 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

(iii) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකයක් ලබා, ආයුර්වේද ආරෝග්‍යශාලාවක වර්ෂයක ප්‍රායෝගික පුහුණුව ලබා තිබීම හෝ අවුරුදු 5 කට නොඅඩු පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්දක් ලබා තිබිය යුතුය ;

හෝ

සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු විය යුතුය.

5. අයැදුම්කරුවන් පහත සඳහන් සහතික පිටපත් ඔවුන්ගේ අයැදුම්පත්වලට ඇමිණිය යුතුය. (මුල් පිටපත් නොවේ) :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. :—බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති අධ්‍යාපන වෘත්තීය හා ශාස්ත්‍රීය සහතික පත්‍ර ;

(ඇ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික පත්‍ර දෙකක්. (රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම උප වගන්තිය යටතේ සහතිකපත්‍ර උවමනා නොකෙරේ.)

**සැලකිය යුතුය.**—අයැදුම්පත් සමග අමුණා එවන කිසිම ලියවිල්ලක් හෝ සහතික පිටපතක් ආපසු එවනු නො ලැබේ.

6. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන පොදු කොන්දේසි මෙම තනතුරු කෙරෙහි ද බලපානු ලැබේ. එකී කොන්දේසි බලන්න.

ඩබ්ලිව්. බී. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1972 දෙසැම්බර් මස 27 දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

## ආදර්ශ ඉල්ලුම්පත

### ආයුර්වේද දෙපාර්තමේන්තුව—ආයුර්වේද රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු

1. සම්පූර්ණ නම :—

(අ) පෙළපත් නාමය :————.

(ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා ස්ථානය. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :—

1973 පෙබරවාරි මස 09 වෙනි දිනට වයස :—

අවුරුදු :——, මාස :——, දින :——.

4. ලාංකිකයෙක් ද නැද්ද යන බව :————.

ලාංකිකයෙක් වූයේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

5. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

6. ඩිප්ලෝමා ලැබූ වෛද්‍යවරයෙක් නම්, ලබා ඇති වෘත්තීය සුදුසුකම්. :————.

(සහතික පිටපත් ඇමිණිය යුතුය)

(i) ලබා ඇති ඩිප්ලෝමාව :————.

අංශය : (යුනානි/ආයුර්වේද/සිද්ධ)*

(ii) එය ලැබූ වර්ෂය :————.

(iii) ලබා ඇති පන්තිය :————.

(iv) ලැබූ ආයතනය :————.

* අදාළ නොවන වචන කපා හරින්න.

7. ලියාපදිංචි වෛද්‍යවරයෙක් නම් ලියාපදිංචි අංකය හා වර්ෂය : :————

8. පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

9. මේතෙක් යම් රජයේ තනතුරක් දැරුවේ නම් එම තනතුරු හා පත්වූ දින, අස්වූ දින හා අස්වීමට හේතු :————.

10. වෙනත් කරුණු :————.

මා විසින් මෙම අයැදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව තෝරා ගැනීමට පෙර දැනගන්නට ලැබුණොත්, මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කළහැකි බවත්, මම දනිමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

1-898—73.01.18 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදි පිළි) නීතිගත සංස්ථාව—සළුසල

#### තත්ත්ව පාලක (රෙදි පිළි) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ

**සුදුසුකම් :**

අධ්‍යාපන.—රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව හෝ ව්‍යවහාර ගණිතය හා ශුද්ධ ගණිතය සහිතව විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාල උපාධියක්.

අයදුම්කරුවන්ට පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් හෝ කිහිපයක් තිබිය යුතුය.

(අ) එංගලන්තයේ ටෙක්ස්ටයිල් ඉන්ස්ටිටියුට්හි ආශ්‍රිත සාමාජිකයෙකු වීම : හෝ

(ආ) තුන් අවුරුදු පළපුරුද්දක් සහිතව රෙදි පිළි සම්බන්ධයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම හෝ ;

(ඇ) අවුරුදු හයක පළපුරුද්දක් සහිතව වී. ජේ. ටී. අයි. හෝ ඊ හා සමාන ඩිප්ලෝමාවක් තිබීම ;

(ඈ) රෙදි පිළි අලෙවි කටයුතු ගැන දැනුම/සහ හෝ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

වයස.—1973 ජනවාරි මස 25 වැනිදාට අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාව.—රු. 900—7×50—රු. 1,250 (සියලු දීමනා සහිත මාසික වැටුප) අතිරේක සුදුසුකම් හා පළපුරුද්ද ඇති පුද්ගලයින් ඉහත වැටුප් පරිමාව අනුව සුදුසු යයි සලකන වැටුප් තලයක තබනු ලැබේ.

අයදුම්කරුවන් නම වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පාසැල හැර යාමෙන් පසුව කළ රක්ෂා සහ පළපුරුද්ද පිළිබඳ සියලු විස්තර සැපයිය යුතු අතර, සහතික හා ලියකියවිලිවල පිටපත් පමණක් (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

දැනටමත් රජයේ සේවයේ, රාජ්‍ය සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සිටින පුද්ගලයින් ඒ ඒ අංශ ප්‍රධානීන් මාර්ගයෙන් තම අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

තෝරා ගත් අයදුම්කරුවා, රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුකූලව හා විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දැනටමත් පනවා ඇති හෝ මින් ඉදිරියට පනවන ඕනෑම රෙගුලාසියකට යටත්ව සේවය කිරීම අවශ්‍ය වේ.

සියලු ඉල්ලුම් පත් 1973 ජනවාරි 25 වැනිදාට හෝ ඊට පෙර පහත අත්සන් කරන මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

සභාපති.

ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව-සළුසල.
93, ජාවත්ත පාර, කොළඹ 5.

1–404—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

### කිරි මණ්ඩලය

#### V වැනි ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරු

කිරි මණ්ඩලීය සේවයේ ඉහත දක්වෙන තනතුරු සඳහා ඉල්ලුම් පත් භාර ගනු ලැබේ. ඉල්ලුම්පත් පහත සඳහන් ආකාරයට සකස් කර 1973.2.3 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. වැටුප.—රු. 600—25×8—රු. 800 මසකට (සියළුම දීමනා සහිතව).

3. **සුදුසුකම්.**—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම්කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1973.2.3 වැනි දිනට අවුරුදු 40 නොවැඩි විය යුතු අතර, අවුරුදු 25ට නොඅඩු විය යුතුය.

(ආ) හොඳ කල්ක්‍රියාවෙන් හා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව.

(ඇ) (i) යාන්ත්‍රික හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා විභාගය, හෝ

(ii) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව I වැනි II වැනි කොටස්, හෝ

(iii) ඉංජිනේරු ආධුනිකයන්ගේ දිවා පාඨමාලා I වැනි හා II වැනි කොටස්, හෝ

(iv) ඉහත සඳහන් පාඨමාලාවන්ට සමාන වෙනත් සුදුසුකම් සමග,

(v) යටත් පිරිසෙයින් යාන්ත්‍රික සහ/හෝ ශීතකරණ ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව 3 අවුරුදු ප්‍රායෝගික පළපුරුද්දක්, සහ

(vi) යාන්ත්‍රික සහ/හෝ ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් අඩු තරමින් එක් අවුරුද්දක අධීක්ෂක තත්ත්වයේ පළපුරුද්දක්.

පිළිගත හැකි කර්මාන්තශාලාවක සේවය කර ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ඇත. පහත සඳහන් විෂයයන් පිළිබඳව පළපුරුද්දක් ඇත්නම් එම අයදුම්කරුගේ ඉල්ලුම්පත කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීමට හේතුවනු ඇත :—

(අ) බොයිලේරු

(ආ) ශීතකරණ යන්ත්‍ර

(ඇ) අශ්ව බල 50 තෙක් විදුලි මෝටර් සහ ස්ටාටර්

(ඈ) පොම්ප

(ඉ) බර යාන්ත්‍රික පිරියත.

4. සේවා කොන්දේසි :

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරා ගනු ලැබුවහොත්, පත්වීම් භාරගැනීමට මත්තෙන්, රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු/විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය ලද රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හල හොත්, මණ්ඩලයට බැඳුනු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48(ඒ) ඡේදය යටතේ ඔහුට හිමිව තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම්පත් සලකා බලනු ලබන්නේ 1965 අගෝස්තු 20 වැනි දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍රලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව, සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවයෙහි ස්ථිර කරන ලද නිලධාරීන් නොවේ නම්, පත්වීම් දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවන තුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත්, එකගව කටයුතු කිරීමේ කොන්දේසියට අයදුම්කරුවන් යටත් විය යුතුය.

(ඈ) 3 අවුරුදු කාලය අවසානයේ දී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණු අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

5. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මේවා ස්ථිර තනතුරු වේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සන් වේ.

6. ඇප.—තෝරාගනු ලබන අයදුම්කරුවන් ඇප මුදල් තැබිය යුතුය.

7. වෛද්‍ය පරීක්ෂණය.—රාජකාරි භාරගැනීමට මත්තෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් රජයේ වෛද්‍ය ආයතනයක දී වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කායයීයන් සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ භාර නොගන්නා බව සැලකිය යුතුය.)

(ආ) ලබාගත් ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන්/විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය.

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටුකරන ලද වැඩ හඳුන්වන සහතික.

9. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කිරි මණ්ඩලයේ සභාපති වෙත හැර මණ්ඩලීය සේවයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට,
කොළඹ 5.

## කිරි මණ්ඩලය

### ඉල්ලුම්පත්‍රය

### V වැනි ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුර

1. සම්පූර්ණ නම :————.

2. පෞද්ගලික ලිපිනය :————.

3. අයදුම්කරු උපන් දින හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

5. ඉල්ලුම්කරු ලබා ඇති අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් : ————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

| විභාගය | සමත් වූ වර්ෂය | සමත් වූ විෂයන් පිළිබඳ විස්තර |
|---|---|---|
| ———— | ———— | ———— |

6. සිංහල සහ/හෝ දෙමළ පිළිබඳ විස්තර :————.

7. කලින් ලබා ඇති පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

| සේවය කළ ආයතනයේ නම | දැරූ තනතුර | සේවා කාලය සිට දක්වා |
|---|---|---|
| ———— | ———— | ———— |

8. දැන් කරන රැකියාවේ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–381—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

### සිංහල ලඝු/යතුරු ලේඛක ලිපිකරු තනතුරු

සංස්ථා සේවයේ සිංහල ලඝු/යතුරුලේඛක ලිපිකරු තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

සුදුසුකම් :

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය නැතහොත් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය) පෙළ පරීක්ෂණයෙන් ලබාගත් විෂයයන් හයක සාමාර්ථය සමග යතුරුලිවීමටත්, කියවන විට ලඝු ලේඛනයෙන් ලියා ගැනීමටත් හැකියාවක් තිබීම.

දෙමළෙන්/ඉංග්‍රීසියෙන් රාජකාරි කටයුතු කිරීමට දැනීමක් තිබීමත් දෙමළ/ඉංග්‍රීසි ලඝුලේඛනයෙන් සහ යතුරුලියනයෙන් හැකියාවක් තිබීමත් ප්‍රයෝජනවත් වේ. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක නැතහොත් පිළිගත් වෙළඳ ආයතනයක පළපුරුද්ද ඇති අය ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප :

සුදුසුකම්, පළපුරුද්ද සහ දැනට රැකියා කරන අය සම්බන්ධයෙන් නම් ඒ ඒ අයගේ වර්තමාන වැටුප යන මේවා අනුව වැටුප තීරණය වේ: කෙසේ වෙතත් එය වැටුප් වර්ධක සහිත වැටුප් පරිමාණයක මසකට රු. 265 කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් වේ.

පළපුරුද්ද සහ සුදුසුකම් පිළිබඳ සියලුම විස්තර ඇතුළත් කොට පිරිස් කළමනාකාර, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7 යන ලිපිනයට 1973 ජනවාරි මස 31 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි අයදුම්පත් එවිය යුතුය.

1–409—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### යාපනය නගරයේ බටහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ පිළිබඳ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය

යාපනය නගරයේ බටහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ පිළිබඳ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය සඳහා අයදුම්පත් 1973 ජනවාරි 31 වෙනි දින දක්වා යාපනය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් භාරගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ මෙහි පහත ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල වන ලෙස ය.

2. පඩි ක්‍රමය.—මේ තනතුර සඳහා රු. 5,160 ක වාර්ෂික ඒකාබද්ධ ස්ථිර වැටුපක් ගෙවනු ලැබේ.

3. විශේෂ දීමනා.—විවාහක දීමනාවද, ලිපිකරුවන්ට ගෙවීම සඳහා දීමනාවක් ද ගෙවනු ලැබේ. මෝටර් රථයක් තබා ගැනීම සඳහා රු. 300 ක විශේෂ දීමනාවක් ද ඇත.

4. සේවා තත්ත්වයන් පිළිබඳ විස්තර—

(i) මේ තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමට යටත් ය.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයා අවුරුදු 3 ක් යන තුරු පරිවාස තත්ත්වයේ තබනු ලැබේ.

(iii) තෝරා පත් කරගනු ලබන අපේක්ෂකයා විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් අනුමත කරනු ලැබුවාවූද, රෙජිස්ට්‍රාර් කොට්ඨාශයේ මධ්‍යස්ථානයක උපකරණ සහිත කාර්යාලයක් පවත්වා ගෙන යා යුතු ය. මේ සඳහා කාර්යාල දීමනාවක් ගෙවනු ලැබේ. (මෙම දීමනාව නිශ්චය කරනු ලබන්නේ පත්වීම කිරීමෙන් පසුවය.)

(iv) කාර්යාලය හැර තිබෙන වේලාවන්.—සතියේ සාමාන්‍ය දින වල දී පූර්වභාග 7 සිට 11 දක්වා හා අපරභාග 2 සිට 5 දක්වා ද වෙයි. රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි හා ඉරිදා දිනයන්හි කාර්යාලය හැර තබන වේලාවන් මෙසේ ය: පූර්වභාග 7 සිට 10 දක්වා හා අපරභාග 2 සිට 4 දක්වාත් ය.

(v) තෝරා ගන්නා ලද අපේක්ෂකයාට පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීමට අවසර දෙනු ලැබේ. එහෙත්, ඔහුට වාණිජ, වෙළඳ හෝ කෘෂිකර්ම ව්‍යාපාරවල යෙදීමට හෝ වෘත්තීය කටයුතු කරන සමාගමක වැඩ කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගේ අවසරය නැතුව ඉඩ නැත.

5. සුදුසුකම්.—සෑම ඉල්ලුම්කරුවෙක්ම—

(i) ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. (උත්පත්තියෙන් හෝ ලියාපදිංචි වීමෙන්.)

(ii) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ දී වයස අවුරුදු 25 ට නොඅඩු සහ 50 ට නොවැඩි විය යුතුය.

සහ

(iii) සෑම අපේක්ෂකයෙක්ම—

(අ) ලියා පදිංචි කරනු ලැබූ වෛද්‍යවරයෙක්, හෝ

(ආ) ස්වදේශීය ඖෂධ ආඥා පනත (106 අධිකාරය) යටතේ ලියා පදිංචි කරනු ලැබූ ස්වදේශීය වෛද්‍ය වරයෙක්, හෝ

(ඇ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (110 වෙනි පරි.) 6 (3) වගන්තිය යටතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක් දරන පුද්ගලයෙකු හෝ විය යුතුය.

6. අනෙකුත් අවශ්‍යතා—

(i) තමා ලංකාවේ පුරවැසියෙකු බව ඔප්පු කරන ලෙස ඉල්ලා සිටි විටක ඒ සඳහා සෑහෙන සාක්ෂි ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

(ii) රජයේ සේවාවන්හි නියුක්ත, සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් එවනු ලබන ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුවේ. රජයේ සේවයේ ස්ථිර පදවි දරන්නන් විසින් එවනු ලබන ඉල්ලුම් පත්‍ර එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ (V වැනි පරි:) 1 වැනි වගන්තිය යටතේ ඔහු එම සේවයෙන් මුදා හැරිය හැකි හෝ නොහැකි බව අනුමත කොට එවිය යුතුයි.

(iii) අපේක්ෂකයන්, දන්වනු ලබන ලද ස්ථානයකට නියමිත වේලාවල සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු ය. මේ සම්බන්ධයෙන් ගමන් ගාස්තු හා වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

(iv) තෝරා ගනු ලැබූ අපේක්ෂකයා රජයේ සේවකයෙක් නොවන්නේ නම් ඔහුගේ හෝ ඇයගේ ශරීර සෞඛ්‍ය තත්ත්වයේ සුදුසුකම් පිළිබඳව වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(v) අයදුම්කරු රජයේ විශ්‍රාම වැටුප් ලබන්නෙක් නම්, තමා ලබන විශ්‍රාම වැටුප් ගණන ප්‍රකාශ කළ යුතු යි.

(vi) කිසියම් කෙනෙක් අපේක්ෂකයකු රෙකමදරු කිරීමට කැමති නම්, සහතික පත්‍රයක් දීමෙන් එය ඉටු කර ගත හැක. මේ සම්බන්ධයෙන් යමෙක් යම් අපේක්ෂකයෙකුට අයථා මාර්ගයෙන් පදවිය ලබා දීම සඳහා ක්‍රියා කළහොත් එය අපේක්ෂකයා නොසුදුසු හැටියට භාරගනු ලැබීමට හේතුවක් වනු ඇත.

(vii) අපේක්ෂකයෙකු තෝරා ගනු ලැබීමට ප්‍රථම ඔහුගේ අයදුම් පත්‍රයෙහි යම් කිසි ප්‍රකාශයක් වැරදි බව පෙනී ගියහොත් අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ.

(viii) මෙම දැන්වීමේ සඳහන් කරුණු වලට සෑම අන්දමින්ම එකඟ නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ.

(ix) පත් කරනු ලැබුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාවේ යෙදවීම පිණිස ද, දැනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන හෝ ඕනෑම ව්‍යවස්ථාවකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(x) ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II අ) වන ඡේදයේ මුල පළවෙන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම්වලට අදාල වූ පොදු කොන්දේසි කියවා බලනු මැනවි.

එච්. එම්. ඉසෙඩ්. ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1972 දෙසැම්බර් මස 27 වැනි දින.
කොළඹ 1,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දී ය.

### ආකෘති පත්‍රය

උප්පැන්න හා මරණ පිළිබඳ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය—යාපනය නගරයේ බටහිර කොට්ඨාශය—ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) සහ වාසස්ථානය :————.

2. (අ) උත්පත්තියෙන් නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියෙක් ද යන වග :————.

(ආ) උපන් ස්ථානය :————.

3. උපන් දිනය :————.

4. විවාකද අවිවාවකද යනවග :————.

5. වෛද්‍යවරයෙකු වශයෙන් ඇති සුදුසුකම් :—

වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කළ දිනය හෝ වර්ෂය :————.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගෙන් ලබාගත් සහතික පත්‍රයක් දරන්නේ නම් එහි දැතම :————.

6. රෙජිස්ට්‍රාර් ධුරයේ වැඩ පිළිබඳ පළපුරුද්දක් ඇත්නම් ඒ කවරේද යනු :————.

7. රජයේ විශ්‍රාම වැටුප් ලබන්නෙක් නම් එම විශ්‍රාම වැටුප් කොපමණද යනු සහ දැනට උසුලන ධුරය :————.

8. භාෂා පිළිබඳ ප්‍රවීණත්වය :—

සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

9. අයදුම්කරු සහතිකපත් ලබාගත් පිළිගත් පුද්ගලයන් දෙදෙනෙකුගේ නම සහ ලිපිනය (සහතික පත්වල පිට පත් අමුණන්න) :—

(1) :————.
(2) :————.

10. විශේෂ සුදුසුකම් (ඇත්නම්) :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කිරීමෙන් පසුව අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සැලකිය යුතුයි.—ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුත්තේ සහතික පත්වල පිටපත් පමණි.

1–407—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

### මාතර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

මාතර දිස්ත්‍රික්කයේ, කඩවත් සතර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා මඩිහ-ගොඩගඩ ගම් සභාව, මාතර නගර සභාව හා නාවිමන-මාකාවිට ගම් සභාව යන පලාත් පාලන ආයතන තුල ස්ථිර පදිංචිය ඇත්තාවූ පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනය කරමි. මේ සඳහා මෙම කාර්යාලයෙන් හෝ මාතර, වැල්ලබඩ පත්තුව බටහිර හා කඩවත් සතර ප්‍රාදේශීය උප දිසාපති කාර්යාලයෙන් හෝ නිකුත් කරනු ලබන අයදුම්පත්වල ඉල්ලා ඇති විස්තර නිසි අයුරු සම්පූර්ණකර අදාල සහතිකවල පිටපත්ද සමග 1973 ජනවාරි මස 25 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචිකල තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

1. ලිපිනය.—දිසාපති, දිසාපති කාර්යාලය, මාතර.

2. සුදුසුකම් :—

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 30 නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩිවීම,

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්තවීම,

(ඇ) අයදුම්කරු ඉහතකී කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය,

(ඈ) (i) 1925 සහ 1944 අතරතුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, නැතහොත්

(iii) සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්වීම.

(ඉ) රජයේ, සංස්ථා හෝ පලාත් පාලන ආයතන සේවකයින් නොවිය යුතුය.

(ඊ) පලාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුය.

3. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික,

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක් (මින් එකක් පළාතේ ග්‍රාම සේවකගෙන් විය යුතුය).

(ඈ) කොට්ඨාශයේ ස්ථිර පදිංචිය පිළිබඳ ග්‍රාම සේවකගේ සහතිකය (මෙය මාතර, ප්‍රාදේශීය උප දිසාපති මගින් ග්‍රාම සේවකට එවිය හැකිය).

4. මීට අමතරව තම අයදුම්පත සමග එම අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය බවටත්, තමා ණයගැති නොවන බවටත් දිවුරුම් සහතිකයක් අමුනා එවිය යුතුය.

5. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ අත් අකුරින්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

6. අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට සිදුවිය හැක. ඒ පිළිබඳව ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීමක් හෝ කරනු නොලැබේ.

ගාමිනි කරුණාරත්න,
මාතර දිසාපති.

1972 දෙසැම්බර් මස 26 වැනි දින,
මාතර, දිසාපති කාර්යාලයේ දීය.

1 334—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

### මීගමුව කඩවීදිය "බී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය

මීගමුව මහා නගර සභා සීමාවේ පිහිටුවීමට යන, මීගමුව කඩවීදිය "බී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපතිවරයෙක් පත් කිරීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම තනතුර සඳහා ගෙවන අඩුම මාසික දීමනාව රු. 50 කි.

2. 1973. 02. 20 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ලාංකිකයින් විය යුතු යි.

3. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටුවන නගර සභා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය /ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/උසස් ගණිතය/ව්‍යවහාර ගණිතය/ගණකාධිකරණය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර/අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී සිටිය යුතු ය.

5. 'මීගමුව කඩවීදිය' උප තැපැල් කාර්යාලය පවත්වා ගෙන යෑමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

6. කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ, අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (කොළඹ/උතුර) කොට්ඨාශයේ, ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත පෝර්ම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 1973. 02. 20 වැනි දින හෝ ඊට පෙර හෝ ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

7. වැඩි දුරටත් විස්තර අවශ්‍ය නම්, ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ලබා ගත හැක.

සී. ජේ. සේරසිංහ,
වැඩබලන පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලිසංදේශ අධ්‍යක්ෂ.

1-402—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

### විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති තනතුර

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම නිවේදනයෙහි අග පලවන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කැරුන අයදුම්පත්, කොළඹ 7, විගණකාධිපති කාර්යාලයේ විගණකාධිපති වෙත, පහත දක්වෙන දිනයනට හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය :—

(අ) මෙරට අයදුම්පත්—1973 පෙබරවාරි 14.

(ආ) විදේශීය අයදුම්පත්—1973 පෙබරවාරි 21.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහල වම් කෙළවරේ "ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

සටහන.—(i) අයදුම්පතක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදුවිය හැකි අලාභහානි තමන් විසින්ම විඳ දරාගත යුතුය.

(ii) විදේශීය අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණකාධිපති වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් තමන්ට ආසන්නම රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්‍යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී බාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය හා යාත්‍රාපත්‍ර.**—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස පිටරටින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යාත්‍රාපත්‍ර වියදමත් එම නිලධාරීන් විසින්ම ගෙවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් නොදරයි නම්, හෙතෙම තම වැටුපෙන් 6% ක මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. රජයේ දායක මුදල වැටුපෙන් 9% ක් වනු ඇත.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි නම්, හෙතෙම තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත.

තෝරාගනු ලබන අපෙක්ෂකයා දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තව නොමැති නම්, මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත ඔහු පත් කෙරෙනු ඇත. තෝරාගනු ලබන අපෙක්ෂකයා රාජ්‍ය සේවයෙහි ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි නම් ඔහුගේ පත්වීම මුල් වතාවේ එක් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප හා දීමනා.**—(අ) ස්ථිර පදනමක් මත, වර්ෂයකට රු. 20,040—600×2—රු. 21,240 වැටුප් පරිමාව යටතේ ඒකාබද්ධ වැටුපක් සමඟ විවාහක දීමනාවක්; හෝ

(ආ) ද්විතීයනය කරනු ලබන සංස්ථා නිලධාරියකුට නම්, ස්වකීය සංස්ථා වැටුප සමඟ දීමනාවක්; හෝ

(ඇ) කොන්ත්‍රාත්තු පිට බඳවා ගනු ලබන නිලධාරියකුට නම්, පළමුවෙන් අවුරුදු 3 කට නොවැඩි කාලසීමාවක් සඳහා විශ්‍රාම වැටුප් රහිත පදනමක් මත මසකට රු. 2,000—50—රු. 2,500 වැටුපක්ද වේ.

සටහන.—තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් හා පළපුරුද්ද ගැන සළකා බලා, ආයතන අධ්‍යක්ෂ සමඟ කතිකාකොට, ඉහත සඳහන් වැටුප් පරිමාණයක සුදුසු පියවරක හෙතෙම තබනු ලැබිය හැකිය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව;

(ආ) 1972 දෙසැම්බර් 07 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි බව; (දැනටමත් රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන් කෙරෙහි මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු බව; හෝ

(ii) පිරිවැය සහ කළමණාකාරිත්ව ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු බව; හෝ

(iii) සහතික කළ සහ ඒකාබද්ධ ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු බව; සහ

(iv) ඉහත සඳහන් වෘත්තීය ආයතනයන්ගේ සාමාජිකත්වය ලැබීමෙන් පසුව, ගණන් තැබීම/මුදල් කලමනාකාරිත්වය සහ/හෝ විගණනය පිළිබඳ අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා ඇති බව.

සටහන.—(අ) රාජ්‍ය සේවයේ (ශ්‍රී ලංකා විගණන සේවයේ සාමාජිකයන් හැර) සහ සංස්ථා සේවයේ මාණ්ඩලික ශ්‍රෙණියක දස අවුරුදු පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් නම්, පශ්චාත් වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද පිළිබඳ කාලසීමාව අවුරුදු 8 ක් වනු ඇත;

(ආ) විගණන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රෙණියේ දස අවුරුදු පළපුරුද්දක් ලබා ඇති ශ්‍රී ලංකා විගණන සේවයේ සාමාජිකයින් වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් නම්, පශ්චාත් වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද අවුරුදු 6 ක් වනු ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම හෝ ඉල්ලා සිටි විටෙක අයදුම්කරුවන් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බවුතීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයෙහි කාර්‍යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(ආ) වෘත්තීය සහ අනිකුත් සුදුසුකම් පිළිබඳ සහතික;

(ඇ) පශ්චාත් වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද පිළිබඳ සහතික (පෞද්ගලික අංශයෙහි සේවාවේ නියුක්ත අපේක්ෂකයන් සඳහා පමණකි.)

(ඈ) චරිතය පිළිබඳව සඳහන් වන මෑතදී ලබාගත් සහතික දෙකක්;

(ඉ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සටහන.—(i) අයදුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලා සිටි විටෙක ලියකියවිලි ඉදිරිපත් කිරීමට අසමත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පතේ එක් පිටපතක්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත කෙළින්ම එවිය යුතුය.

7. අයදුම්පත් සහ ඒ හා සම්බන්ධ සෙසු ලියුම්කියුම් විගණකාධිපති වෙතම මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ)වැනි ඡේදය ආරම්භයේ සඳහන් වන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණ බව, අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුලතදී අපේක්ෂකයින් වෙත දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නොලැබුණ හොත්, ඒ බව කොළඹ 7, විගණකාධිපති කාර්යාලයේ, විගණකාධිපති වෙත වහාම දැන්විය යුතුය.

පී. එම්. ඩබ්ලිව්. විජයසූරිය,
විගණකාධිපති.

1973 ජනවාරි මස 03 වෙනි දින,
විගණකාධිපති කාර්යාලය,
කොළඹ 7.

ආදර්ශ අයදුම් පත්‍රය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති තනතුර

අංකය :————.

(කාර්‍යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්—වාසගම හෙවත් අගට යෙදෙන නමට යටින් ඉරක් අඳින්න.)

2. තැපැල් ලිපිනය :————.

3. (අ) උපන් දිනය :—අවුරුද්ද :———, මාසය :———, දිනය:———.
(ආ) 1972.12.07 වැනි දිනට වයස :—, අවුරුදු :———, මාස :———, දින :————.

4. ජාතිය :—
(අ) ලාංකිකත්වය පරම්පරාවෙන්ද ලියාපදිංචි කිරීමෙන්ද යන වග : ————.
(ආ) ලාංකිකත්වය පරම්පරාවෙන් නම් පහත සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :—
(i) අයදුම්කරු :————.
(ii) අයදුම්කරුගේ පියා :————.
(iii) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(පිය පාර්ශවයේ මුත්තා)
(iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
(පිය පාර්ශවයේ මී මුත්තා)

5. ශාස්ත්‍රීය/අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගය/උපාධිය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| | | |

6. වෘත්තීය සුදුසුකම් :—

| විස්තර | එම සුදුසුකම් ලබාගත් දිනයන් |
|---|---|
| | |

7. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :—
(අ) තනතුර :————.
(ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :————.
(ඇ) පත්වූ දිනය :————.
(ඈ) ස්ථිරද, විශ්‍රාම වැටුප් සහිතද, තාවකාලිකද නැතහොත් කොන්ත්‍රාත්තු පිටද යන වග :————.
(ඉ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ ඇත්ද යන වග :————.
(ඊ) වාර්ෂික වැටුප් පරිමාණය :————.
(උ) දැනට ලබන වාර්ෂික වැටුප :————.

8. වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසු නිරතවූ රැකියාවන් පිළිබඳ විස්තර :—

| තනතුර සහ කාර්‍යයන්ගේ ස්වභාවය | දෙපාර්තමේන්තුව/ආයතනය | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|---|
| | | | | |

9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
සිංහල දෙමළ ඉංග්‍රීසි

10. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයින් දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :—
(i) ————.
(ii) ————.

11. තවත් තොරතුරු ඇතොත් ඒවා :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ, මා තෝරාගැනීමට පෙර දැනගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයෙහි නිරත නම්, ඔහු පිළිබඳව
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/අමාත්‍යාංශ
ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

1-399—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

යොමු අංකය : සාප/20/166.

අධ්‍යාපන අමාත්‍යාංශය

පේරාදෙණිය ගුරු විද්‍යාලයේ භාෂා පර්යේෂණාගාරයේ

කාර්මික සහකාර තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ පේරාදෙණිය ගුරු විද්‍යාලයේ භාෂා පර්යේෂණාගාරයේ කාර්මික සහකාර තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1973.02.12 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම් තැනවෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාලසීමාව අවුරුදු 3 ක් වන්නේය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුව හොත් පත්වීම නියමිත කාලයකට වැඩ බැලීමේ පදනමක් මත වේ.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(v) බඳවාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

3. වැටුප් හා දීමනා.—වර්ෂයකට රු. 3,864 — 18 × 144 — රු. 6,456ක ඒකාබද්ධ වැටුප් ක්‍රමය හිමි වේ. රු. 5,304 ඒකාබද්ධ වාර්ෂික වැටුප් වැඩිවීමට පෙර කාර්‍යක්ෂමතා කඩඉමකි.

සටහන.—1969.10.1 දිනට පෙර පැවති මීට අනුරූප වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 1,620—120—රු. 3,780 වේ. කාර්‍යක්ෂමතා කඩඉම් වාර්ෂික රු. 2,820 වැටුපට පෙර.

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—(i) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ).

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(iii) රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය, (ශුද්ධ හෝ ව්‍යවහාරික) ඇතුළු විෂයයන් 6 කින් පොදු අධ්‍යයන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුයි.

(iv) ශබ්ද පටිගත කිරීමේ උපකරණ ක්‍රියාකරවීම හා සාමාන්‍ය නඩත්තු කිරීම පිළිබඳව යටත් පිරිසෙයින් තුන් අවුරුදු පළපුරුද්දක් තිබිය යුතුය. වැදිරිය තුළ ශබ්ද ගතකිරීම පිළිබඳ දැනීමක් තිබීම වඩාත් මැනවි.

(v) විදුලි/ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනීමක්/පළපුරුද්දක් හා පරීක්ෂණ උපකරණ පාවිච්චි කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

අතිරේක සුදුසුකම්.—(i) මි.මී. 16 ශබ්ද චිත්‍රපටි සහ මි.මී. 35 චිත්‍රපටි පිළිබඳ විශේෂයක් ඇතිව ප්‍රක්ෂේපකයක උපකරණ ක්‍රියා කරවීමේ හා සාමාන්‍යයෙන් නඩත්තු කිරීමෙහි පළපුරුද්ද ; හා

(ii) නොයෙක් ආකාරයෙන් යුත් ඡායාරූප කැමරා භාවිතය, ලියකියවිලි පිටපත් කිරීම හා ඡායාරූප විශාල කිරීම හා සම්බන්ධ අඳුරු කාමර ක්‍රියා මාර්ගය පිළිබඳ පළපුරුද්ද ආදී අතිරේක සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙකුම සූදානම් විය යුතුය :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය ;

(ආ) 4(iv) සහ (v) ඡෙදයේ සඳහන් සහතික පත්‍ර ;

(ඇ) සිංහලෙන් සමත්වී ඇති ඉහළම විභාගය දක්වෙන සහතිකය ;

(ඈ) උප්පැන්න සහතිකය.

සටහන.—(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නො එවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නො ලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්ත මේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් බාරගන්නා අවසාන දිනය පසුවී දින 21ක් ඇතුළත ඉල්ලුම් පත් ලැබුණ බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973.01.12,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

යොමුව : සාප/20/166.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
උපන් දිනය :————.

5. උපන් ස්ථානය :
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

.6 ලාංකිකත්වය පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද යනවග :————

7. අධ්‍යාපන සුදුසුකම් :
(i) සාමාන්‍ය :————.
(ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
(iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස් ම විභාගයේ විස්තර :
————.

8. නිවේදනයේ 4 වැනි ඡෙදයේ (IV) සහ (V) අනුඡෙද යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයන්, දරූ තනතුරු සඳහන් කළ යුතුයි) :—

| තනතුර | සේවය කළ ආයතනය | සේවා කාලය | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

9. විවාහකද, අවිවාහකද, වැන්දඹුද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් :
(අ) දිනය :————.
(ආ) නඩු නොම්මරය :————.
(ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

13. සේවාමුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තරය :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :————.
(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පලාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :
(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :
(i) ආයතනයේ නම :————.
(ii) තනතුර හා ශ්‍රේණිය :————.
(iii) ඊට පත්වූ දිනය :————.
(iv) විශ්‍රාම වැටුප් සහිත ද තාවකාලික හෝ අනියම් ද ? :————.
(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :—.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

දිනය :————.                ————, අයදුම්කරුගේ අත්සන.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා ගේ සහතිකය

මගේ අංකය :

ඔබේ අංකය : සාප/20/166.

අධ්‍යා./ලේ.,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම් පත බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය*

ඉල්ලුම් පත්‍රයේ ............................ අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් *බැව් මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි :—

..............................................................

..............................................................

..................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය : ..............................

දිනය ..................

*අදාල නැති කොටස් කපා හරින්න.

1–342—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විඅා/4/144.

අධ්‍යාපන අමාත්‍යාංශය

1973 ඉන්දියානු රජයේ සාමාන්‍ය සංස්කෘතික ශිෂ්‍යත්ව

ඉන්දීය රජයේ සාමාන්‍ය සංස්කෘතික ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ 1973 වර්ෂයේ සිට පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ ප්‍රථම උපාධි අධ්‍යාපනය සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පශ්චාත් උපාධි මට්ටමේ ඉගෙනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍ර පිළිබඳව සීමාවක් නැත. එහෙත් පූර්ව උපාධි මට්ටමේ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් බාරගනු ලබන්නේ පහත සඳහන් විෂයයන් සඳහා පමණී.

"අ" ගණය —
1. වාස්තු විද්‍යාව
2. ඉංජිනේරු විද්‍යාව

"ආ" ගණය —
1. කෘෂිකර්මය
2. ආහාර කාර්මික විද්‍යාව
3. වන සංරක්ෂණය
4. පෝෂකර්ම විද්‍යාව
5. බෙහෙත් මිශ්‍රණය
6. ගෘහ විද්‍යාව

"ඇ" ගණය —
1. වෛද්‍ය විද්‍යාව
2. දන්ත වෛද්‍ය විද්‍යාව
3. පශු වෛද්‍ය විද්‍යාව

"ඈ" ගණය —
1. සංගීතය
2. නැටුම්
3. ප්‍රජා සංවර්ධනය හා ග්‍රාමීය අභිවෘද්ධිය

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකියයුතු සේවයක් ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ. පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.

(අ) ස්ථිර තනතුරු දරණ හා තනතුරුවල ස්ථිරකර ලැබ සිටින රජයේ නිලධාරීන් ;

(ආ) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා එවැනි වෙනත් රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන ආයතනවල සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන් ;

(ඇ) දැනටමත් ලංකාවේ හෝ විදේශයක හෝ විශ්ව විද්‍යාලයක කිසියම් පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

සංලක්ෂ්‍යය 1.—රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ කිසියම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇයගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේ දී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

සංලක්ෂ්‍යය 2.—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

සංලක්ෂ්‍යය.—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

**2. ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය තෝරාගනු ලබන පාඨමාලාව අනුව වන්නේ ය. පශ්චාත් උපාධි සඳහා නම්, සාමාන්‍යයෙන් අවුරුදු 2ක් පමණ ද පූර්ව උපාධිය සඳහා නම් අවුරුදු 4 සිට 6 පමණද විය හැකියි.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඉන්දියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

**3. සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්කරුවන්ගේ වයස 1973.6.1 දිනට අවුරුදු 25 ට අඩුවිය යුතුයි. එහෙත් අවුරුදු 20-22 අතර අයදුම් කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම් කරුවන්ගේ වයස 1973.6.1 දිනට අවුරුදු 20 ට අඩුවිය යුතුය.

(iii) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්කරුවන් අනුගමනය කිරීමට අදහස් කරන පාඨමාලාවට අදාල විෂයයන්ගෙන් ලබාගත්, පිළිගත් විශ්ව විද්‍යාලයක දෙවැනි පෙළ උපාධියක්වත් යටත් පිරිසෙයින් ලබා සිටිය යුතුයි.

(iv) පූර්ව උපාධි මට්ටමේ ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් :—

(අ) අයදුම් කරන්නේ (අ) ගණය යටතේ පාඨමාලාවක් සඳහා නම්, පහත සඳහන් සාමාර්ථයන් ද ඇතුලත්ව යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් වත් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව සිටිය යුතුය.

(1) ශුද්ධ ගණිතය හෝ උසස් ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(2) භෞතික විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(3) රසායන විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් අතරින් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයක් හා අනික් විෂයයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ;

නැතහොත්

ඉන්දියාවේ පිළිගත් මේ හා සමාන විභාගයකදී උසස් ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබිය යුතුයි.

(ආ) අයදුම්කරන්නේ (ආ) ගණය යටතේ පාඨමාලාවක් සඳහා නම් පහත සඳහන් සාමාර්ථයන්ද ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් වත් දෙවතාව කට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව සිටිය යුතුයි.

(1) ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන දෙකම හෝ භෞතික විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(2) රසායන විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(3) භෞතික විද්‍යාව හා ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන් අතරින් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයක් හා අනික් විෂයයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ;

(4) ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් ලබා සිටිය යුතුය ;

නැතහොත්

ඉන්දියාවේ පිළිගත් මේ හා සමාන විභාග යකදී උසස් ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඇ) අයදුම් කරන්නේ "ඇ" ගණය යටතේ පාඨමාලා වක් සඳහා නම් අ. පො. ස. (උසස් පෙළ) විභාග යේදී එක් වතාවකදීම විෂයයන් 3 කින් සාමාර්ථය ලබා සිටිය යුතු අතර එම අවස්ථාවේදීම රසායන විද්‍යාව හා පහත සඳහන් විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් දෙකක්වත් සමත් වී සිටිය යුතුය :—

උද්භිද විද්‍යාව
සත්ව විද්‍යාව
භෞතික විද්‍යාව

නැතහොත්

ඉන්දියාවේ පිළිගත් මේ හා සමාන විභාගයකදී උසස් ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

අයදුම් කරන්නේ "ඇ" ගණය යටතේ පාඨමාලාවක් සඳහා නම්, පහත සඳහන් සාමාර්ථයන්ද ඇතුළුව යටත් පිරිසෙයින් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සා./පෙ.) විභාගය සමත්ව සිටිය යුතුය :—

(1) සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ;

(2) ඉල්ලුම් කරන්නේ සංගීතය සඳහා නම්—අ. පො. ස. (සා./පෙ.) විභාගයේ සංගීතය විෂයයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඒ හා සමාන හෝ උසස් වෙනත් විභාගයකින් ලත් සාමාර්ථයක්.

ඉල්ලුම් කරන්නේ නැටුම් සඳහා නම්—රජයේ සංගීත හා නැටුම් විභාගයේ අන්තර් මධ්‍ය සහතිකය/ලංකා ගාන්ධර්ව සභා සහතිකය හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකමක් ;

ඉල්ලුම් කරන්නේ ප්‍රජා සංවර්ධන හා ග්‍රාමීය අභිවෘද්ධිය සඳහා නම්—භූගෝලය සහ ප්‍රජාචාරය යන විෂයයන් අතුරින් එකකින් සම්මාන සාමාර්ථයක් සහ අනෙකින් සාමාන්‍ය සාමාර්ථයක් ද සමග සමාජ සේවා හෝ ශුභසාධක කටයුතුවල නිරතව සිටින බවට ලබාගත් සහතික දෙකක්.

සංලක්ෂ්‍යය 1 : රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1973. 6. 1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

සංලක්ෂ්‍යය 2 : එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු හා වෙනත් සියලුම අනිවාර්ය ගාස්තු,

(ආ) පි එච්. ඩී. උපාධි පාඨමාලාවන් සඳහා රු. 300 සීමාවට යටත්වද, වෛද්‍ය විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් සඳහා රු. 200 සීමාවට යටත්වද, පොත්පත් උපකරණ ආදී වියදම්,

(ඉ) ඉහත (ආ) යටතේ නියමිත සීමාව ඇතුළත ප්‍රබන්ධය ටයිප් කිරීම පිළිබඳ නියමිත ගණන් අනුව වියදම්. මෙය ගෙවනු ලබන්නේ ඉන්දියාවෙන් පිටත්වීමට පෙර ප්‍රබන්ධය ඉදිරිපත් කළහොත් පමණි,

(ඊ) පාඨමාලාවට සම්බන්ධ අධ්‍යාපන චාරිකා සඳහා නියමිත ගණන් අනුව වියදම්,

(උ) ඉඳුම්-හිටුම්, කෑම්-බීම් ආදිය සඳහා මසකට රු. 300 බැගින් යැපීම් දීමනාවක්,

(ඌ) වෛද්‍ය නිලධාරියාගේ හෝ ආයතන ප්‍රධානියාගේ උපදෙස් පිට ලබන වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ සියලුම වියදම්,

(එ) ඉන්දියානු රජය අනුමත කළ විවේක කඳවුරු හෝ තරුණ කඳවුරුවලට සහභාගිවීම පිළිබඳව ගමන් වියදම් හා දෛනික දීමනාවක්,

(ඔ) සන්ධාන පාඨමාලාවලට සහභාගිවන ශිෂ්‍යයින්ට නියමිත ප්‍රමාණයන් අනුව ගමන් වියදම්.

සැලකිය යුතුයි.—ඉන්දියාවට යෑමේ හා ආපසු පැමිණීමේ ගමන් වියදම් තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින්ම දැරිය යුතුව ඇත.

සංලක්ෂ්‍යය : මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීතිරීතින්ට යටත් වන්නේ ය.

5. සම්මුඛ පරීක්ෂණය.—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. ගිවිසුම.—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉන්දියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදු වූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ශ්‍රී ලංකා රජයට ආපසු ගෙවීමටද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

7. වෛද්‍ය පරීක්ෂණය.—තෝරාගනු ලබන අපේක්ෂකයින් ඉන්දියාවේදී අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එසින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවනතුරු අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 26.1.1973 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ඒ ඒ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් ඉදිරිපත් කළ යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම්දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 29 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

1–401—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ පැතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළු දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළක්රිමේ දිනය | | | ගැසට් පත්‍රයේ පල කිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 | සිකුරාද | ... | 72.12.27 | බදාද | දවල් | 12.00 |
| | 73. 1.12 | සිකුරාද | ... | 73. 1. 3 | බදාද | දවල් | 12.00 |
| | 73. 1.19 | සිකුරාද | ... | 73. 1.10 | බදාද | දවල් | 12.00 |
| | 73. 1.26 | සිකුරාද | ... | 73. 1.17 | බදාද | දවල් | 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 | සිකුරාද | ... | 73. 1.24 | බදාද | දවල් | 12.00 |
| | 73. 2. 9 | සිකුරාද | ... | 73. 1.31 | බදාද | දවල් | 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්ද | ... | 73. 2. 7 | බදාද | දවල් | 12.00 |
| | 73. 2.23 | සිකුරාද | ... | 73. 2.14 | බදාද | දවල් | 12.00 |
| මාර්තු | 73. 3. 2 | සිකුරාද | ... | 73. 2.21 | බදාද | දවල් | 12.00 |
| | 73. 3. 9 | සිකුරාද | ... | 73. 2.28 | බදාද | දවල් | 12.00 |
| | 73. 3.16 | සිකුරාද | ... | 73. 3. 7 | බදාද | දවල් | 12.00 |
| | 73. 3.23 | සිකුරාද | ... | 73. 3.14 | බදාද | දවල් | 12.00 |
| | 73. 3.30 | සිකුරාද | ... | 73. 3.21 | බදාද | දවල් | 12.00 |
| අප්‍රේල් | 73 4. 4. | සිකුරාද | ... | 73. 3.28 | බදාද | දවල් | 12.00 |
| | 73. 4.11. | බදාද | ... | 73. 4. 4 | බදාද | දවල් | 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්ද | ... | 73. 4.11 | බදාද | දවල් | 12.00 |
| | 73. 4.27 | සිකුරාද | ... | 73. 4.18 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව. කොළඹ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.